## ධීවරයින් භාරදීමට සහ භාරගැනීමට නාවික හමුදා සහය

ශ්‍රී ලංකා අත්අඩංගුවේ සිට නිදහස් කෙරුණු ඉන්දීය ධීවරයින් 51 දෙනෙකු ඉන්දීය රජය වෙත භාරදීම සහ ඉන්දීය රජයේ අත්ඩංගුවේ සිට නිදහස ලැබූ ශ්‍රී ලාංකික ධීවරයින් 3 දෙනෙකු යලි මෙරටට භාරදීම ඊයේ දින (ජන 10) සිදුවූ අතර ඒ සඳහ ශ්‍රී ලංකා නාවික හමුදාව සහය දැක්වූ බව ශ්‍රී ලංකා නාවික හමුදා නිල වෙබ් අඩවිය පවසයි.

මෙම කටයුත්ත යාපනය කන්කසන්තුරයට උතුරින් වූ අන්තර්ජාතික මුහුදු සීමාවේදී සිදු කෙරුනු අතර, ඒ සඳහා නාවික හමුදාවට අයත් *L 820* යාත්‍රාව *(Sri Lanka Navy's Landing Craft - L 82)* සහ ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ *CG 48* යාත්‍රාව *(Sri Lanka Coast Guard Craft - CG 48)* මෙන්ම ඉන්දීය වෙරළාරක්ෂක බලකායේ 'සාගර්' *(Sagar)* නෞකාව සහභාග වූ බව එම පුවත වැඩිදුරටත් සඳහන් කරයි.